Lesson 62

Sad Life

දුක්ඛිත ජීවිතය

It was getting dark by then. Sandun was feeling very tired. He had walked a long way from his village to the town

ඉට් වෝස් ගෙටිං ඩාක් බයි දෙන්. සඳුන් වෝස් ෆීලිං වෙරි ටය(ර්)ඩ්. හී හැඩ් වෝක්ඩ් අ ලෝං වේ ෆ්‍රොම් හිස් විලේජ් ටු ද ටවුන් .

ඒ වනවිට අඳුර වැටෙමින් තිබුණි. සඳුන් හට බොහෝ වෙහෙස දැනුනි. ඔහු ඔහුගේ ගමේ සිට නගරය දක්වා බොහෝ දුරක් ඇවිද තිබුණි

He thought of his family. His mother must be worried about him by now. He hadn't told her where he was going .

හී තෝට් ඔෆ් හිස් ෆැමිලි. හිස් මද(ර්) මස්ට් බී වොරීඩ් අබවුට් හිම් බයි නව්. හී හැඩ්න්ට් ටෝල්ඩ් හ(ර්) වෙයා(ර්) හී වෝස් ගොයිං

ඔහු ඔහුගේ පවුලේ අය ගැන සිතුවා. මේ වෙනකොට ඔහුගේ මව ඔහු පිළිබඳ බොහෝ කනගාටුවට පත්ව ඇති. ඔහු ඇයට කියා තිබුනේ නැහැ ඔහු යන්නේ කොහෙද කියා

He thought of his little brothers. They must be hungry and crying. He knew that there was nothing at home to cook .

හී තෝට් ඔෆ් හස් ලිට්ල් බ්‍රද(ර්)ස් . දේ මස්ට් බී හංග්‍රි ඇන්ඩ් ක්‍රයිං. හී නිව් දැට් දෙයා වෝස් නතිං ඇට් හෝම් ටු කුක් .

ඔහු ඔහුගේ බාල සහෝදරයන් ගැන සිතුවා . ඔවුන් දැන් බොහෝ බඩගිනි වී හඬනවා ඇති . ඔහු දැන සිටියා ගෙදර ඉවීමට කිසි දෙයක් නොමැති බව

He felt very sad . He felt like crying . Sandun’s father was very ill . He was bed ridden

හී ෆෙල්ට් වෙරි සෑඩ් . හී ෆෙල්ට් ලයික් ක්‍රයිං සදුන් ‘ස් ෆාද(ර්) වෝස් වෙරි ඉල් . හී වෝස් බෙඩ් රිඩ්න්

ඔහුට ගොඩක් දුක සිතුනා. ඔහුට හැඬෙන්න වගේ දැනුනා (ඔහුට හැඬුම් ආවා) සදුන්ගේ තාත්තා ඉතා අසනීපව සිටියේ. ඔහු එක්තැන්ව සිටියේ (bed ridden- බෙඩ් රිඩ්න් -ඇඳට වැටුණු)

After his father fell ill, their life became very difficult

ආෆ්ට(ර්) හිස් ෆාද(ර්) ෆෙල් ඉල්, දෙයා(ර්) ලයිෆ් බිකේම් වෙරි ඩිෆිකල්ට්

ඔහුගේ තාත්තා ලෙඩ වුනු පසු ඔවුන්ගේ ජීවිතය ඉතා අපහසු වුනා (fall ill -ෆෝල් ඉල් - ලෙඩ වෙනවා / fell ill - ෆෙල් ඉල් - ලෙඩ වුනා)

His mother cannot go to work because of his little brothers. And she needed to be at home to attend to his father too.
හිස් මදැ(ර්) කැනොට් ගෝ ටු ව(ර්)ක් බිකෝස් ඔෆ් හිස් ලිට්ල් බ්‍ර(දැ(ර්)ස් . ඇන්ඩ් ෂී නීඩඩ් ටු බී ඇට් හෝම් ටු අටෙන්ඩ් ටු හිස් ෆාදැ(ර්) ටූ
ඔහුගේ මවට වැඩකට යන්න බැහැ ඔහුගේ බාල සොයුරන් නිසා . ඔහුගේ තාත්තට සාත්තු කරන්නත් ඇයට ගෙදර ඉන්න වුනා (attend - ඇටෙන්ඩ් - සාත්තු සප්පායම් කරනවා)

Their life was full of hardships.His uncles and aunts helped a bit but they couldn't do it everyday.
දෙයා ලයිෆ් වෝස් ෆුල් ඔෆ් හාඩ්ෂිප්ස් . හිස් අංකල්ස් ඇන්ඩ් ආන්ට්ස් හෙල්ප්ඩ් අ බිට් බට් දේ කුඩ්න්ට් ඩූ ඉට් එව්රිඩේ.
ඔවුන්ගේ ජීවිතය දුෂ්කරතා වලින් පිරුණු එකක් වුනා. ඔහුගේ මාමලා සහ නැන්දලා ටිකක් උදව් කලා නමුත් එය හැමදාම කරන්න ඔවුන්ට බැරි වුනා

So he wanted to find some work to earn some money .That’s why he left home without telling his mother and walked to the small town.
සෝ හී වෝන්ටඩ් ටු ෆයින්ඩ් සම් ව(ර්)ක් ටු අ(ර්)න් සම් මනි. දැට්ස් වයි හී ලෙෆ්ට් හෝම් විතවුට් ටෙලිං හිස් මදැ(ර්) ඇන්ඩ් වෝක්ඩ් ටු ද ස්මෝල් ටවුන්
ඒ නිසා ඔහුට අවශ්‍ය වුනා මොනවා හරි වැඩක් හොයා ගන්න සල්ලි කීයක් හරි හම්බ කරගන්න. අන්න ඒ නිසයි ඔහු ඔහුගේ මවට කියන්නේ නැතුව ගෙදරින් පිටත් වෙලා කුඩා නගරයට ඇවිද ගියේ.

He went from place to place looking for some work but nobody gave him work. They did not want to employ a child. It was illegal.
හී වෙන්ට් ෆ්‍රොම් ප්ලේස් ටු ප්ලේස් ලුකිං ෆෝ සම් ව(ර්)ක් බට් නෝබොඩි ගේව් හිම් ව(ර්)ක් . දේ ඩිඩ් නොට් වෝන්ට් ටු එම්ප්ලෝයි අ චයිල්ඩ්. ඉට් වෝස් ඉලීගල්.
ඔහු තැනින් තැනට ගියා වැඩක් හොයමින් නමුත් කව්රුවත්ම ඔහුට වැඩක් දුන්නේ නැහැ . ඔවුන්ට අවශ්‍ය වුනේ නැහැ ළමයෙක්ව වැඩට ගන්න . එය නීති විරෝදී වුනා (
(illegal-ඉලීගල්- නීති විරෝදී)

Now he felt tired. He felt very hungry and thirsty too. He began to think it was foolish to come here.
නව් හී ෆෙල්ට් ටය(ර්)ඩ්. හී ෆෙල්ට් වෙරි හංග්‍රි ඇන්ඩ් ත(ර්)ස්ටි ටූ . හී බිගෑන් ටු තිංක් ඉට් වෝස් ෆූලිෂ් ටු කම් හියැ(ර්)
දැන් ඔහුට මහන්සියි . ඔහුට බඩගිනි සහ පිපාසය දැනුනා . ඔහු හිතන්න පටන් ගත්ත මෙහි ආපු එක හරි මෝඩයි කියලා (මෝඩ වැඩක් කියලා)

It was getting dark and people were rushing home. Nobody cared about him . He was walking weakly
ඉට් වෝස් ගෙටිං ඩාක් ඇන්ඩ් පීපල් ව(ර්) රෂිං හෝම්. නෝ බොඩි කෙයාඩ් අබවුට් හිම්. හී වෝස් වෝකිං වීක්ලි

අඳුර වැටි ගෙන එමින් තිබුනා සහ මිනිසුන් ගෙදර දොර බලා කඩිමුඩියේ යමින් හිටියා . කිසිකෙනෙක් ඔහු ගැන සැලකුවේ නැහැ . ඔහු දුර්වල ලෙස ඇවිද්දා
(rush - රෂ් - හනික යනවා / care - කෙයා - සලකනවා / weak - වීක් - දුර් වල / weakly - වීක්ලි - දුර්වල ලෙස)

Nobody asked why he was there or what he was doing . He wanted to cry. And he wanted to go back home
නෝබොඩි ආස්ක්ඩ් වයි හී වෝස් දෙයා ඕ වට් හී වෝස් ඩුයිං. හී වෝන්ටඩ් ටු ක්‍රයි. ඇන්ඩ් හී වෝන්ටඩ් ටු ගෝ බැක් හෝම්
කිසි කෙනෙක් ඇහුවේ නැහැ ඔහු එහි (ආවේ) ඇයි කියලා හෝ ඔහු කරමින් සිටින්නේ කුමක්ද කියා . ඔහුට අවශ්‍ය වුනා අඬන්න, ඒ වගේම ඔහුට අවශ්‍ය වුනා ගෙදර යන්න

He started walking back to his village . Now it was almost dark .He needed to hurry .His mother must be very worried.She must be looking for him everywhere.
හී ස්ටාටඩ් වෝකිං බැක් ටු   හිස් විලේජ්. නව් ඉට් වෝස් ඕල්මොස්ට් ඩාක් .
හී නීඩඩ් ටු හරී. හිස් මදැ(ර්) මස්ට් බී වෙරි වොරීඩ් . ෂී මස්ට් බී ලුකිං ෆෝ හිම් එව්රිවෙයා
ඔහු පටන් ගත්තා ආපහු ඔහුගේ ගමට යන්න. දැන් හොදටම කළුවර වැටිලා . ඔහු ඉක්මන් කල යුතු වුනා. ඔහුගේ මව බොහෝ කනස්සල්ලට පත්ව සිටිය යුතුයි .
ඇය හැම තැනම ඔහුව සොයනවා විය යුතුයි   (hurry - ඉක්මන් කරනවා)

He wanted to be with his family as soon as possible . He knew they had nothing to eat at home but being with them was a comfort
හී වෝන්ටඩ් ටු බී විත් හිස් ෆැමිලි ඇස් සූන් ඇස් පොසිබල්. හී නිව් දේ හැඩ් නතිං ටු ඊට් ඇට් හෝම් බට් බීං විත් දෙම් වෝස් අ කොම්ෆෝට්
ඔහුට අවශ්‍ය වුනා හැකි ඉක්මනින් ඔහුගේ පවුල සමග එක්වන්න . ඔහු දැන හිටියා ඔවුන්ට ගෙදර කන්න මුකුත් නෑ කියලා නමුත් ඔවුන් සමග සිටීම සුව පහසුවක් වුනා (as soon as possible - හැකි ඉක්මනින්) (comfrot - සුව පහසුව)

He passed the town area. Now the road was almost empty. Nobody was there to be seen . A drizzle started
 හී පාස්ඩ් ද ටවුන් ඒරියා . නව් ද රෝඩ් වෝස් ඕල්මෝස්ට් එම්ප්ටි . නෝ බොඩි වෝස් දෙයා ටු බී සීන්. අ ඩ්‍රිස්ල් ස්ටාටඩ්
ඔහු නගර ප්‍රදේශය පසු කලා . දැන් පාර එහෙම්පිටින්ම වගේ හිස් . කව්රුවත් පේන්න හිටියේ නැහැ . පොද වැස්සක් පටන් ගත්තා (drizzle - ඩ්‍රිස්ල් - පොද වැස්ස)

He wanted to run, but his body was weak. Just then he saw someone walking toward him. It looked like an old man
හී වෝන්ටඩ් ටු රන් බට් හිස් බොඩි වෝස් වීක්. ජස්ට් දෙන් හී සෝ සම්වන් වෝකිං ටුවෝඩ් හිම් . ඉට් ලුක්ඩ් ලයික් ඇන් ඕල්ඩ් මෑන්
ඔහුට ඕන වුනා දුවන්න , නමුත් ඔහුගේ ශරීරය දුර්වලයි . එතකොටම ඔහු දැක්කා කව්ද ඔහු දිහාවට ඇවිදන් එනවා. ඒ වයසක මනුස්සයෙක් වගේ පෙනුනේ

At first he could not see him properly from a distance . When he got closer he could see him clearly . He looked like a kind old gentleman
ඇට් ෆ(ර්)ස්ට් හී කුඩ් නොට් සී හිම් ප්‍රොප(ර්)ලි ෆ්‍රොම් අ ඩිස්ටන්ස්. වෙන් හී ගොට් ක්ලෝස(ර්) හී කුඩ් සී හිම් ක්ලියර(ර්)ලි . හී ලුක්ඩ් ලයික් අ කයින්ඩ් ඕල්ඩ් ජෙන්ට්ල්මන්
මුලදී , ඔහුට හරියට ඔහුව පෙනුනේ නෑ දුරට .ඔහු ලං වුනාම ඔහුට ඔහුව හොඳට පෙනුනා . ඔහු කරුණාවන්ත වයසක මහත්තයෙක් වගේ පෙනුනෙ (at first - මුලදී) (properly - ප්‍රොප(ර්)ලි - හරියට , නිසියාකාරව) (distance - ඩිස්ටන්ස්- දුර)

“Grandpa “ , Sandun called out. The old gentleman looked at him curiously
“ග්‍රෑන්ඩ් පා “, සඳුන් කෝල්ඩ් අවුට්. දි ඕල්ඩ් ජෙන්ට්ල්මන් ලුක්ඩ් ඇට් හිම් කියුරියස්ලි
“සීයේ” , සදුන් කතා කලා. වයසක මහත්තයා ඔහු දිහා කුතුහලයෙන් බැලුවා (curiously - කියුරියස්ලි - කුතුහලයෙන්)

“Yes, little one, what are you doing here on the road ? Where are you going ? “ He asked
යස් , ලිට්ල් වන් , වට් ආ යු ඩුයිං හියර(ර්) ඔන් ද රෝඩ් ? වෙයා ආ යූ ගොයිං ? “ හී ආස්ක්ඩ්
“ඔව් පොඩි ළමයෝ , ඔයා මොනවද පාරේ කරන්නේ ? ඔයා කොහෙද යන්නේ ?” ඔහු ඇසුවා

“Grandpa , I came here to find a job “ Sandun said
ග්‍රෑන්පා, අයි කේම් හිය(ර්) ටු ෆයින්ඩ් අ ජොබ්” සදුන් සේඩ්
“සීයේ , මම මෙහෙ ආවේ රස්සාවක් හොයා ගන්න” සදුන් කිව්වා

“ A job !“ The old gentleman asked in a surprised tone
“අ ජොබ් !” දී ඕල්ඩ් ජෙන්ට්ල්මන් ආස්ක්ඩ් ඉන් අ ස(ර්)ප්‍රයිස්ඩ් ටෝන්
“රස්සාවක් !” වයසක මහත්තය පුදුමයට පත් ස්වරයකින් ඇහුවා (surprised – සප්‍රයිස්ඩ් - පුදුමයට පත්)

“Yes, grandpa, We have nothing to eat at home “
“යස් ග්‍රෑන්පා , වී හැව් නතිං ටු ඊට් ඇට් හෝම්”
“ඔව් සීයේ ,අපිට ගෙදර කන්න මුකුත් නැහැ “

“Where are you from ? “
“වෙයා ආ යූ ෆ්‍රොම් ? “
“ඔයා කොහේ ඉදන්ද ? “

“I am from Medagama”
“අයැම් ෆ්‍රොම් මැදගම”
“මම මැදගම “

“Medagama ? That’s a bit far from here . How can you walk back home now ?. What does your father do? “
“මැදගම ? දැට්ස් අ බිට් ෆා ෆ්‍රොම් හියර්). හව් කැන් යූ වෝක් බැක් හෝම් නව් ? වට් ඩස් යුවර්) ෆාදර්) ඩූ ?
මැදගම ? මෙහෙ ඉදන් ටිකක් දුරනේ . ඔයා කොහොමද දැන් පයින් ගෙදර යන්නේ ? ඔයාගේ තාත්තා මොකද කරන්නේ ? “ (a bit - ටිකක්) (far - ෆා - දුර)

“He has fallen ill. He is in bed. It is difficult for my mother to feed us “ Sandun said in a shaky voice
“හී හැස් ෆෝලන් ඉල් . හී ඉස් ඉන් බෙඩ්, ඉට් ඉස් ඩිෆිකල්ට් ෆෝ මයි මදර්) ටු ෆීඩ් අස් “ සදුන් සේඩ් ඉන් අ ශේකි වොයිස්
ඔහු අසනීප වෙලා ඉන්නේ. ඔහු එක්තැන් වෙලා. මගේ අම්මට අමාරුයි අපට කන්න දෙන්න.” වෙව්ලන ස්වරයෙන් සදුන් කිව්වා (shaky - ශේකි - සෙලවෙන)

“How many kids are there in your family ?”
“හව් මෙනි කිඩ්ස් ආ දෙයා ඉන් යුවර්) ෆැමිලි ?”
“ඔයාගේ පව්ලේ ළමයි කීයක් ඉන්නවද ?”) (kid -කිඩ් - ළමයා)

“There are 4 of us. I have 3 little brothers. The youngest is an infant”
“දෙයා ආ ෆෝ ඔෆ් අස් , අයි හැව් ත්‍රී ලිට්ල් බ්‍රදර්)ස්. ද යංගස්ට් ඉස් ඇන් ඉන්ෆන්ට්”
“අපි හතර දෙනෙක් ඉන්නවා, මට මල්ලිලා 3 දෙනෙක් ඉන්නවා, බාලම එක්කෙනා අත දරුවෙක්”
(young - යං - බාල , තරුණ / youngest - යංගස්ට් - බාලම) (infant - ඇත දරුවා)

“Oh, I see, Who will give you a job ,child ? Nobody will . You are a kid, You are too young to work . Anyway, let’s go to my house, it’s nearby. Have you eaten anything ? “ the old gentleman asked kindly
ඕ, අයි සී , හූ විල් ගිව් යූ අ ජොබ්, චයිල්ඩ් ? නෝ බොඩි විල් , යූ ආ අ කිඩ් , යූ ආ ටූ යං ටු වර්)ක් . එනිවේ , ලෙට්ස් ගෝ ටු මයි හවුස් , ඉට්ස් නියර්)බයි . හැව් යූ ඊට්න් එනිතිං ? “ දි ඕල්ඩ් ජෙන්ට්ල්මන් ආස්ක්ඩ් කයින්ඩ්ලි

ආ ,එහෙමද ,ඔයාට කව්ද ළමයා රස්සාවක් දෙන්නේ ? කව්රුවත් දෙන එකක් නෑ . ඔයා පොඩි ළමයෙක්. ඔයා රස්සාවවක් කරන්න බාල වැඩියි , කොහොම වුනත් , අපි යමු මගේ ගෙදරට , ඒක මේ ලග . ඔයා මොනවා හරි කාලද ? වයසක මහත්තයා කාරුණිකව ඇසුවා (nearby - නියර් බයි - ළඟ පාත)

“No, grandpa , I haven’t . I am very hungry” his voice cracked
“නෝ, ග්‍රෑන්පා , අයි හැව්න්ට් . අයැම් වෙරි හංග්‍රි “ හිස් වොයිස් ක්‍රැක්ඩ්
“නෑ සීයේ , මම කාල නැහැ , මට හරි බඩගිනියි “ඔහුගේ කටහඬ බිඳුනා

“Don’t worry , We will give you something to eat . Only my wife and I are living here . You can stay with us tonight and go back home tomorrow. “
“ඩෝන්ට් වොරි , වී විල් ගිව් යූ සම්තිං ටු ඊට් . ඔන්ලි මයි වයිෆ් ඇන්ඩ් අයි ආ ලිවිං හියර් . යූ කැන් ස්ටේ විත් අස් ටුනයිට් ඇන්ඩ් ගෝ බැක් ටුමාරෝ “
කනගාටු වෙන්න එපා , අපි ඔයාට මොනවා හරි දෙන්නම් කන්න. මායි මගේ බිරිඳයි විතරයි මෙහේ ඉන්නේ . ඔයාට පුළුවන් අද රෑ අපිත් එක්ක ඉදල හෙට ආපහු ගෙදර යන්න

“No, grandpa, I want to go home tonight . My mother must be worried. I came without telling her”
“නෝ, ග්‍රෑන්පා , අයි වෝන්ට් ටු ගෝ හෝම් ටුනයිට්. මයි මද(ර්) මස්ට් බී වොරීඩ්. අයි කේම් විතවුට් ටෙලිං හ(ර්)
“නෑ සීයේ, මට අද රෑම ගෙදර යන්න ඕනා, මගේ අම්ම හොදටම කලබල වෙලා ඇති. මම ආවේ එයාට(ඇයට) කියන්නේ නැතුව “

“Oh, Gosh !, How can you go home now ? There are no buses running at this time . How can you walk so far ? You have to pass isolated areas and even cemeteries. It ‘s not safe to walk at this time .”
“ඕ ගොෂ් , හව් කැන් යූ ගෝ හෝම් නව් ? දෙයා ආ නෝ බසස් රනිං ඇට් දිස් ටයිම් . හව් කැන් යූ වෝක් සෝ ෆා? යූ හැව් ටු පාස් අයිසොලේටඩ් ඒරියාස් ඇන්ඩ් ඊවන් සෙමිට්‍රීස්. ඉට්ස් නොට් සේෆ් ටු වෝක් ඇට් දිස් ටයිම් “
“අපොයි ! ඔයා කොහොමද දැන් ගෙදර යන්නේ ? මේ වෙලාවට දුවන බස් නෑ . ඔයා කොහොමද එච්චර දුර ඇවිදින්නේ ? ඔයාට පාලු මංඩි වගේම මිනී කනත්තවල් පවා පහු කරන්න වෙනවා . මේ වෙලාවේ පයින් යන එක ආරක්ෂිත නැහැ .” (isolated - අයිසොලේටඩ් - තනි , පාලු) (cemetery - සෙමිට්රි - කනත්ත) (It ‘s = It is)

Sandun didn’t know what to do. He wanted to get away from this unfamiliar area and be with his beloved family. But there was no way he could get back now. He was almost crying

සදුන් ඩිඩ්න්ට් නෝ වට් ටු ඩූ. හී වෝන්ටඩ් ටු ගෙට් අවේ ෆ්‍රොම් දිස් අන්ෆමිලිය(ර්) ඒරියා ඇන්ඩ් බී විත් හිස් බිලවඩ් ෆැමිලි. බට් දෙයා වෝස් නෝ වේ හී කුඩ් ගෙට් බැක් නව්. හී වෝස් ඕල්මොස්ට් ක්‍රයිං
මොනවා කරන්නදැයි සදුන් දැන හිටියේ නැහැ . ඔහුට අවශ්‍ය වුනා මේ නුපුරුදු පලාතෙන් ගැලවී ගොස් ඔහුගේ ආදරණීය පවුලේ අය සමග එක් වන්න. නමුත් ඔහුට දැන් ආපසු යන්න කිසිම විදියක් තිබුනේ නැහැ . ඔහු හඩමින් වගේ හිටියේ (unfamiliar - අන්ෆැමිලිය(ර්) - නුහුරු , නුපුරුදු)

They reached the old man’s house . His wife was surprised to see a child with him . She was a very kind woman too. She felt very sympathetic after hearing Sandun’s story. She hurriedly prepared some food for him
දේ රීච්ඩ් දි ඕල්ඩ් මැන්’ස් හවුස් . හිස් වයිෆ් වෝස් ස(ර්)ප්‍රයිස්ඩ් ටු සී අ චයිල්ඩ් විත් හිම් . ෂී වෝස් අ වෙරි කයින්ඩ් වුමන් ටූ . ෂී ෆෙල්ට් වෙරි සිම්පතටික් ආෆ්ට(ර්) හියරිං සදුන්’ස් ස්ටෝරි . ෂී හරීඩ්ලි ප්‍රිපෙයාඩ් සම් ෆුඩ් ෆෝ හිම්
ඔවුන් වයසක මිනිසාගේ ගෙදරට ලඟා වුනා . ඔහුව ළමයෙකු සමග දැකීමෙන් ඔහුගේ බිරිඳ පුදුමයට පත් වුනා. ඇයත් හරිම කරුනාවන්ත කාන්තාවක් .සදුන්ගේ කතාව ඇසීමෙන් පසු ඇයට බොහෝ අනුකම්පා හිතුනා. ඇය කඩිනමින් ඔහුට කෑම ටිකක් පිළියෙළ කළා (sympathetic - සිම්පතටික් - අනුකම්පා සහගත) (hurriedly- හනි හනික)

“Please eat something and fill up your tummy , little one . You seem to be very hungry “ she said, giving him a plate of rice and curry
“ප්ලීස් ඊට් සම්තිං ඇන්ඩ් ෆිල් අප් (ෆිලප්) යුව(ර්) ටමි , ලිට්ල් වන් . යූ සීම් ටු බී වෙරි හංරි.” ෂී සේඩ්, ගිවිං හිම් අ ප්ලේට් ඔෆ් රයිස් ඇන්ඩ් කරී
“මොනවා හරි කාල ඔයාගේ බඩ පුරව ගන්න , පොඩි දරුවෝ. ඔයාට ගොඩාක් බඩගිනි වගෙයි . “ ඔහුට බත් හොදි පිගානක් දෙමින් ඇය කිව්වා (tummy - ටමි - බඩ) (plate - පිඟාන)

Sandun was very happy to get something to eat. He quickly gulped down a few morsels, but then he suddenly began to think.
සදුන් වෝස් වෙරි හැපි ටු ගෙට් සම්තිං ටු ඊට් . හී ක්වික්ලි ගල්ප්ඩ් ඩවුන් අ ෆිව් මෝසල්ස් ,බට් දෙන් හී සඩ්න්ලි බිගෑන් ටු තිංක් .
කන්න මොනවා හරි ලැබුණු එක ගැන සඳුන් ගොඩක් සතුටු වුනා . ඔහු ඉක්මනින් කටවල් කිහිපයක් ගිල දැමුවා ,නමුත් ඊළගට ඔහු හදිසියේම කල්පනා කරන්න පටන් ගත්තා (quickly - ඉක්මනින්) (gulp - ගල්ප් - ගිලිනවා) (morsel - මෝසල් - (කෑම) කටක්)

He knew his mother had nothing to cook at home. Could she find something to cook ? Did someone give her something ?
හී නිව් හිස් මද(ර්) හෑඩ් නතිං ටු කුක් ඇට් හෝම්. කුඩ් ෂී ෆයින්ඩ් සම්තින් ටු කුක් ? ඩිඩ් සම්වන් ගිව් හ(ර්) සම්තිං ?

ඔහු දැන හිටියා ඔහුගේ මවට ගෙදර මුකුත්ම නොතිබුණු බව උයන්න .ඇයට හැකිවුනාද මොනවා හරි හොයාගන්න උයන්න ? කව්රු හරි ඇයට මොනවා හරි දුන්නද ?

Were his little brothers going hungry tonight ? Were they crying out of hunger ? A lot of thoughts were coming to his mind .Tears welled up in his eyes and rolled down his cheeks .
ව(ර්) හිස් ලිට්ල් බ්‍රද(ර්)ස් ගොයීං හංග්‍රි ටුනයිට් ? ව(ර්)දේ ක්‍රයිං අවුට් ඔෆ් හංග(ර්) ? අ ලොට් ඔෆ් තෝට්ස් ව(ර්) කමිං ටු හිස් මයින්ඩ්. ටිය(ර්)ස් වෙල්ඩ් අප් ඉන් හිස් අයිස් ඇන්ඩ් රෝල්ඩ් ඩවුන් හිස් චීක්ස්
අද රෑ ඔහුගේ බාල සහෝදරයන් බඩගින්නෙද ඉන්නේ ? ඔවුන් බඩගින්නේ අඬනවද ? ගොඩාක් සිතිවිලි ඔහුගේ මනසට ආවා. ඔහුගේ ඇස් වලට කඳුළු පිරිලා කම්මුල් දිගේ ගලා ගෙන ගියා

“ What are you thinking of , little one ? “ The old gentleman asked
“වට් ආ යූ තිංකිං ඔෆ් , ලිට්ල් වන් ?” දි ඕල්ඩ් ජෙන්ට්ල්මන් ආස්ක්ඩ්
“මොනවද පොඩි එකෝ කල්පනා කරන්නේ ?” වයසක මහත්තයා ඇහුවා

“ My mother has nothing to cook grandpa , My little brothers must be crying now “
“මයි මද(ර්) හෑස් නතිං ටු කුක් ග්‍රෑන්ඩ් පා. මයි ලිට්ල් බ්‍රද(ර්)ස් මස්ට් බී ක්‍රයිං නව් “
“අම්මට උයන්න මුකුත් නෑ සීයේ. මගේ මල්ලිලා දැන් අඬනවා ඇති”

“Oh , Don’t think about it. I am sure your mother found something to cook .
“ඕ , ඩෝන්ට් තිංක් අබවුට් ඉට්. අයෑම් ෂුව(ර්) යුව(ර්) මද(ර්) ෆවුන්ඩ් සම්තිං ටු කුක් “
“ඒ ගැන හිතන්න එපා . මට විශ්වාසයි ඔයාගේ අම්ම මොනවා හරි හොයා ගන්න ඇති උයන්න “

“There’s no one to give her food or money grandpa “
“දෙයා(ර්)ස් නෝ වන් ටු ගිව් හ(ර්) ෆුඩ් ඕ මනී ග්‍රෑන්පා”
“එයාට කෑම හරි සල්ලි හරි දෙන්න කෙනෙක් නෑ සීයේ”

“Don’t worry about them now. Tomorrow morning I will give you some goods and money too. You can give it to your mother “ The old gentleman said kindly
“ඩෝන්ට් වොරි අබවුට් දෙම් නව් .ටුමෝරෝ මෝනිං අයි විල් ගිව් යූ සම් ගුඩ්ස් ඇන්ඩ් මනි ටූ. යූ කෑන් ගිව් ඉට් ටු යුව(ර්) මද(ර්) .” දි ඕල්ඩ් ජෙන්ට්ල්මන් සේඩ් කයින්ඩ්ලි
“දැන් ඒගොල්ලෝ ගැන කරදර වෙන්න එපා. හෙට උදේ මම ඔයාට දෙන්නම් බඩු ටිකකුයි , සල්ලියිත්. ඔයාට පුළුවන් ඒක අම්මට දෙන්න “ වයසක මහත්තයා කාරුණිකව කිව්වා (goods - ගුඩ්ස් - බඩු)

Sadun felt relieved but knew he had to wait until the next morning. He wanted to be at home right now, but there was no way he could do it
සදුන් ෆෙල්ට් රිලීව්ඩ් බට් නිව් හී හෑඩ් ටු වේට් අන්ටිල් ද නෙක්ස්ට් මෝනිං. හී වෝන්ටඩ් ටු බී ඇට් හෝම් රයිට් නව්. බට් දෙයා වෝස් නෝ වේ හී කුඩ් ඩූ ඉට්
සදුන්ට සහනයක් දැනුනා , නමුත් ඔහු දන්නවා ඔහුට ඊලග දවසේ උදේ වෙනකල් ඉන්න වෙනවා කියලා .ඔහුට අවශ්‍ය වුනා දැන්මම ගෙදර යන්න. නමුත් ඔහුට ඒක කරන්න කිසිම විදියක් තිබුනේ නැහැ (feel relieved - ෆීල් රිලීව්ඩ් - සහනයක් දැනෙනවා) (no way - කිසිම විදියක් නැහැ)

“Finish it all, little one, eat well , I will give you more if you need “ The old lady said while stroking his head
“ෆිනිෂ් ඉට් ඕල් ලිට්ල් වන් , ඊට් වෙල් , අයි විල් ගිව් යූ මෝ ඉෆ් යූ නීඩ් “ දි ඕල්ඩ් ලේඩි සේඩ් වයිල් ස්ට්‍රෝකිං හිස් හෙඩ් “
“ඔක්කොම ඉවර කරන්න, පොඩි ළමයෝ, හොදට කන්න , මම තව දෙන්නම් ඔයාට ඕනේ නම් “ ඔහුගේ ඔලුව අත ගාන ගමන් වයසක නෝනා කිව්වා (stroke - ස්ට්‍රෝක් - අත ගානවා)

“This is enough for me grandma “
“දිස් ඉස් ඉනෆ් ෆෝ මී ග්‍රෑන්මා “
“මට මේ ඇති ආච්චි “ .

හොදයි , ඒ කෙටි කතාවේ හරිම වැදගත් වාක්‍යය ගොඩාක් ආවා. ඔබ ඉගෙන ගත් ව්‍යාකරණ හොදින් මනසේ තහවුරු වෙන්නත් , ඉංග්‍රීසි භාෂාවේ වාක්‍යය ගොඩ නැගෙන ,විදිය පිළිවෙල ගැන හොඳ අවබෝධයක් ලැබෙන්නත් කියවීම ඉතාම වැදගත් . ඒ නිසා මෙතැන් සිට ඉදිරියට තිබෙන කියවීම සදහා දී තිබෙන පාඩම් ඉතා හොදින් අධ්‍යනය කරන්න. ඒවායේ වාක්‍යය ඉතා ඕනෑකමින් අවධානයෙන් ,ඒවායේ භාෂාව පිලිබඳ අවධානයෙන් කියවන්න . එය ඔබේ ඉංග්‍රීසි භාෂාව දියුණු කිරීමට බොහෝ ඉවහල් වේවි .
පහත දැක්වෙන්නේ ඉහත කෙටි කතාවේ අඩංගු වූ වාක්‍යය වලින් ඔබට ඉතාම වැදගත් විය හැකි වාක්‍යය කීපයක් . ඒවා මෙන්ම අන් සියලු වාක්‍යයත් නැවත නැවත කියවන්න

He hadn't told her where he was going .
හී හැඩ්න්ට් ටෝල්ඩ් හ(ර්) වෙයා(ර්) හී වෝස් ගොයිං
ඔහු ඇයට කියා තිබුනේ නැහැ ඔහු යන්නේ කොහෙද කියා

He felt like crying
හී ෆෙල්ට් ලයික් ක්‍රයිං
ඔහුට හැඩෙන්න වගේ දැනුනා

He was bed ridden
හී වෝස් බෙඩ් රිඩ්න්
ඔහු එක්තැන්ව සිටියේ

Their life was full of hardships
දෙයා ලයිෆ් වෝස් ෆුල් ඔෆ් හාඩ්ෂිප්ස්
ඔවුන්ගේ ජීවිතය දුෂ්කරතා වලින් පිරුණු එකක් වුනා

It was illegal.
ඉට් වෝස් ඉලීගල්.
එය නීති විරෝදී වුනා

Nobody cared about him
නෝ බොඩි කෙයාඩ් අබවුට් හිම්
කව්රුවත් ඔහු ගැන තැකුවේ නැහැ

He was walking weakly
හී වෝස් වෝකිං වීක්ලි
ඔහු දුර්වල ලෙස ඇවිද්දා

Nobody was there to be seen
නෝ බොඩි වෝස් දෙයා ටු බී සීන්
කව්රුවත් පේන්න හිටියේ නැහැ

It looked like an old man
ඉට් ලුක්ඩ් ලයික් ඇන් ඕල්ඩ් මෑන්
ඒ වයසක මනුස්සයෙක් වගේ පෙනුනේ

At first he could not see him properly from a distance
ඇට් ෆ(ර්)ස්ට් හී කුඩ් නොට් සී හිම් ප්‍රොප(ර්)ලි ෆ්‍රොම් අ ඩිස්ටන්ස්
මුලදී , ඔහුට හරියට ඔහුව පෙනුනේ නෑ දුරට

The old gentleman looked at him curiously
දි ඕල්ඩ් ජෙන්ට්ල්මන් ලුක්ඩ් ඇට් හිම් කියුරියස්ලි
වයසක මහත්තයා ඔහු දිහා කුතුහලයෙන් බැලුවා

That’s a bit far from here
දැට්ස් අ බිට් ෆා ෆ්‍රොම් හියර්)
මෙහෙ ඉදන් ටිකක් දුරනේ

How can you walk back home now ?
හව් කැන් යූ වෝක් බැක් හෝම් නව් ?
ඔයා කොහොමද දැන් පයින් ගෙදර යන්නේ ?

I came without telling her
අයි කේම් විතවුට් ටෙලිං හ(ර්)
මම ආවේ ඇයට කියන්නේ නැතුව

It's not safe to walk at this time
ඉට්ස් නොට් සේෆ් ටු වෝක් ඇට් දිස් ටයිම්
මේ වෙලාවේ පයින් යන එක ආරක්ෂිත නැහැ

Sandun didn't know what to do
සදුන් ඩිඩ්න්ට් නෝ වට් ටු ඩු
මොනවා කරන්නදැයි සදුන් දැන හිටියේ නැහැ

There was no way he could do it
දෙයා වෝස් නෝ වේ හී කුඩ් ඩූ ඉට්
නමුත් කිසිම විදියක් තිබුනේ නැහැ ඔහුට ඒක කරන්න

She hurriedly prepared some food for him
ෂී හරීඩ්ලි ප්‍රිපෙයාඩ් සම් ෆුඩ් ෆෝ හිම්
ඇය කඩිනමින් ඔහුට කෑම ටිකක් පිළියෙළ කළා

You seem to be very hungry
යූ සීම් ටු බී වෙරි හංරි
ඔයාට ගොඩාක් බඩගිනි වගෙයි

He quickly gulped down a few morsels
හී ක්වික්ලි ගල්ප්ඩ් ඩවුන් අ ෆිව් මෝසල්ස්
ඔහු ඉක්මනින් කටවල් කිහිපයක් ගිල දැමුවා

Tears welled up in his eyes and rolled down his cheeks .
ටියා(ර්)ස් වෙල්ඩ් අප් ඉන් හිස් අයිස් ඇන්ඩ් රෝල්ඩ් ඩවුන් හිස් චීක්ස්
ඔහුගේ ඇස් වලට කඳුළු පිරිලා කම්මුල් දිගේ ගලා ගෙන ගියා

Vocabulary 62

bed ridden - බෙඩ් රිඩ්න් - එක්තැන් වූ

attend - ඇටෙන්ඩ් - සාත්තු සප්පායම් කරනවා

hardships - හාඩ්ෂිප්ස් - දුෂ්කරතා

employ - එම්ප්ලෝයි - වැඩට ගන්නවා

illegal - ඉලීගල් - නීති විරෝධී

foolish - ෆූලිෂ් - මෝඩ

weakkly - වීක්ලි - දුර්වල ලෙස

comfort - කම්ෆ(ර්)ට් - සැප පහසුව

comfortable - කම්ෆටබල් - සුවපහසු

distance - ඩිස්ටන්ස් - දුර

curiously - කියුරියස්ලි - කුතුහලයෙන්

gentleman - ජෙන්ට්ල්මන් - මහත්මයා

tone - ටෝන් - හඬේ ස්වරය

far - ෆා - දුර

feed - ෆීඩ් - කවනවා, පොවනවා

shaky - ශේකි - සෙලවෙන

young - යං - බාල , තරුණ

younger - යංග(ර්) - වඩා බාල

youngest - යංගස්ට් - බාලම

infant - ඉන්ෆන්ට් - බිලිඳා

kid - කිඩ් - දරුවා

nearby - නිය(ර්)බයි - ළඟ පාත

kindly - කයින්ඩ්ලි - කාරුණිකව

crack - ක්‍රැක් - බිඳෙනවා

voice - වොයිස් - කටහඬ

stay - ස්ටේ - නතරව සිටිනවා

isolate - අයිසොලේට් - තනි කරනවා

isolated - අයිසොලේටඩ් - තනි වූ , පාලු

cemetery - සෙමෙට්‍රී - සොහොන , කනත්ත

safe - සේෆ් - ආරක්ෂිත

unsafe - අන්සේෆ් - අනාරක්ෂිත

get away - ගෙට් අවේ - ඉවත්ව යනවා , ගැලවී යනවා

familiar - ෆමිලියර්) - හුරුපුරුදු

unfamiliar - අන්ෆමිලියර්) - නුපුරුදු

beloved - බිලවඩ් - ආදරණීය

sympathy - සිම්පති - අනුකම්පාව

sympathetic - සිම්පතටික් - අනුකම්පා සහගත

hurriedly - හරීඩ්ලි - හනි හනික

prepare - ප්‍රිපෙයා - සූදානම් කරනවා

tummy - ටමී - බඩ

plate - ප්ලේට් - පිඟාන

gulp - ගල්ප් - ගිලිනවා

morsel - මෝසල් - (ආහාරයක) කට

suddenly - සඩ්න්ලි - හදිසියේම

goods - ගුඩ්ස් - බඩු

stroke - ස්ට්‍රෝක් - අත ගානවා